**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

**<u>මඩකලපුව ශික්ෂණ රෝහලේ ශල්‍ය ඒකකය ඉදිකිරීම සම්බන්ධයෙන් වන ව්‍යාපෘති සම්පාදක කමිටුව රැස් වේ</u>**

මඩකලපුව ශික්ෂණ රෝහලේ ශල්‍ය ඒකකය ඉදිකිරීම සම්බන්ධයෙන් වන ව්‍යාපෘති සම්පාදක කමිටු රැස්වීමක් නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් විනෝද්. කේ. ජේකබ් මැතිතුමාගේ සහ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එස්. ජානක ශ්‍රී චන්ද්‍රගුප්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2021 මාර්තු 16 වන දින පැවැත්විණ. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංවර්ධන සහයෝගිතා අංශ ප්‍රධානී සහ පළමු ලේකම් එල්ඩෝස් මැතිව් පුන්නූස් මැතිතුමා විසින් මෙම රැස්වීම පවත්වන ලදී. ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය, මඩකලපුව ශික්ෂණ රෝහල, ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු වන මල්වත්ත කන්ස්ට්‍රක්ෂන්ස් සමාගම සහ ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය විසින් පත් කරන ලද උපදේශක වන CECB ආයතනය නියෝජනය කරමින් නියෝජිතයන් ද මෙම රැස්වීමට සහභාගී විය.

ශ්‍රී ලංකා රුපියල් මිලියන 275ක් වටිනා ව්‍යාපෘතියේ ප්‍රගතිය මෙම රැස්වීමේදී සමාලෝචනය කරන ලදී. ශල්‍ය ඒකකයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ වූ පසු එය මඩකලපුව ප්‍රදේශයේ සෞඛ්‍ය සේවාවට විශාල දායකත්වයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජය සමඟ ජනතා කේන්ද්‍රීය සංවර්ධන සහයෝගීතාවය අඛණ්ඩව ඉදිරියට ගෙනයාමට ඉන්දීය රජය දරන ප්‍රයත්නයේ කොටසකි. ශ්‍රී ලංකාව සඳහා ඉන්දියාව මෙතෙක් ලබා දී ඇති සංවර්ධන ආධාර ඇමරිකානු ඩොලර් බිලියන 3.5ක් පමණ වන අතර එයින් ඇමරිකානු ඩොලර් මිලියන 560ක්ම ප්‍රදාන වශයෙන් ලබා දී ඇත.

****

**කොළඹ**

**2021 මාර්තු 16**